සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved



# දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019
# Second Term Test - Grade 10 - 2019

නම/විභාග අංකය : ................................ ඉතිහාසය - I කාලය : පැ. 01යි.

**උපදෙස්**

* සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 80 හිමිවේ.
* අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරු අතුරෙන් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
* ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) යොදන්න.
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

(01) ලංකා ඉතිහාසය හැදෑරීමේ දී වැදගත්වන ප්‍රශස්ති කාව්‍ය කුමක් ද?
(1) සීතාවක හටන (2) පැරකුම්බා සිරිත
(3) රාජාවලිය (4) වන්සත්තප්පකාශනී

(02) පහත මූලාශ්‍රය අතරින් අභිලේඛනමය මූලාශ්‍රය වර්ගයට අයත්වන මූලාශ්‍රය කුමක් ද?
(1) තඹපත් (2) කාසි (3) නටබුන් (4) චිත්‍ර

(03) ශ්‍රී ලංකාවේ සිතියම නිර්මාණය කරන ලද ක්ලෝඩියස් ටොලමි විසින් රචනා කරන ලද කෘතිය කුමක් ද?
(1) එදා හෙළදිව (2) ඉන්ඩිකා
(3) නැචුරාලිස් හිස්ටෝරියා (4) භූගෝල ශාස්ත්‍ර ප්‍රවේශය

(04) කාසි හෙවත් නානක මූලාශ්‍රය සම්බන්ධයෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) පොළොන්නරු යුගයේ සිට ලංකාවේ කාසි භාවිතය ආරම්භ විය.
(2) ශ්‍රී ලංකාවේ භාවිතා වූ පැරණිතම කාසි වර්ගය මස්ස නමින් හැඳින්වේ.
(3) කාසි නිපදවීමට භාවිත කළ ලෝහ වර්ගය අනුව රටේ ආර්ථිකය පිළිබඳ නිගමනය කළ නොහැකිය.
(4) කාසි හෙවත් නානක මූලාශ්‍ර මඟින් අතීත ලෝහ තාක්ෂණය පිළිබඳ තොරතුරු අනාවරණය කරගත හැකිය.

(05) බෞද්ධ පොත පත සොයා ඉන්දියාව හරහා ලංකාවට පැමිණ දෙවසරක් මෙහි වාසය කරමින් ලංකාව පිළිබඳ තොරතුරු ලියා තැබුවේ කවුරුන්ද?
(1) ෆාහියන් හිමි (2) හියුංසියැං හිමි (3) ඉත්සින් (4) පාඕචාං

(06) ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගය සම්බන්ධයෙන් සාධක හමුවන ඉරණමඩු සැකැස්ම නම් පාංශු ස්තරය නිර්මාණය වූ අවධිය වන්නේ,
(1) පූර්ව ඓතිහාසික අවධියේය. (2) හෝලෝසීන අවධියේ දීය.
(3) පැලියෝලිතික යුගයේ දීය. (4) ප්ලයිස්ටොසීන යුගයේ දීය.

(07) පහත (i) තීරුවේ දැක්වෙන තොරතුරු (ii) තීරුවේ දැක්වෙන තොරතුරු හා කිසියම් සබඳතාවයක් ඇත. (i) තීරුවේ අනුපිළිවෙළ අනුව (ii) තීරුව ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

| (i) තීරුව | (ii) තීරුව |
|---|---|
| 1. නවා වකුටු කරන ලද ඇටසැකිල්ල | A. බුද්දන්නේ හෙළ |
| 2. ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් පැරණිම සාධක හමුවීම. | B. කළුදිය පොකුණ |
| 3. දසගම් ඇත්තන් | C. පොතාන |
| 4. එක්තැන්සමිය | D. පතිරාජවෙල |

(1) ACDB (2) BACD (3) CDBA (4) DBAC




EXAMRESULTS.LK

(08) ජ්‍යාමිතික ක්ෂුද්‍රශිලා මෙවලම් තනාගැනීම සඳහා සුළු වශයෙන් ප්‍රයෝජනයට ගත් අර්ධ මැණික් විශේෂ වන්නේ කුමක් ද?
(1) බිම් විදුරු ය. (2) කහද ය. (3) මරෙන්චි ය. (4) පුෂ්පරාග ය.

(09) ක්‍රි. පූ 2400 සිට 1800 දක්වා කාල වකවානුව තුළ දැකිය හැකි විශේෂ ලක්ෂණය කුමක් ද?
(1) එය ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් පැරණිතම කාල වකවානුව වීමයි.
(2) ශිලා මෙවලම් පමණක් භාවිත කිරීමයි.
(3) යකඩ මෙවලම් පමණක් භාවිත කිරීමයි.
(4) ශිලා මෙවලම් හා යකඩ මෙවලම් භාවිතයයි.

(10) ක්‍රි. පූ. 250 දී පමණ රචනා කර ඇති බ්‍රාහ්මීය සෙල්ලිපියක 'පුර කමත' යනුවෙන් හඳුන්වා ඇත්තේ,
(1) නගර පාලක (2) නගර උද්‍යානය
(3) නගරයේ ප්‍රධාන වාස්තු ශිල්පියා (4) නගර ආරක්ෂක නිළධාරියා

(11) 
ඡායාරූපයේ දැක්වෙන ආකාරයේ වැව් පද්ධතීන් වියළි කලාපයේ ගැමියන් විසින් හඳුන්වනු ලබන්නේ කෙසේ ද?
(1) වැව් ප්‍රපතනය නමිනි. (2) එල්ලංගාව නමිනි.
(3) අවරණ නමිනි. (4) වාපි ගම්මාන නමිනි.

(12) ශ්‍රී ලංකාවේ පළමුවරට ග්‍රාම සීමා ලකුණු කිරීම සම්බන්ධ පාලකයා කවුරුන් ද?
(1) විජය රජතුමා (2) පණ්ඩුවාසදේව රජතුමා
(3) පණ්ඩුකාභය රජතුමා (4) දේවානම්පියතිස්ස රජතුමා

(13) මහවැව් ඉදිකරමින් රටේ ආර්ථික සංවර්ධනය උදෙසා මහගු මෙහෙවරක් සිදුකර මින්නේරි දෙවියන් ලෙස පූජනීයත්වයට පත් රාජ්‍ය පාලකයා කවුරුන් ද?
(1) කුටකණ්ණ අභය රජු (2) මහසෙන් රජු (3) පළමුවන කාශ්‍යප රජු (4) නිශ්ශංකමල්ල රජු

(14) පහත සිදුවීම් අතුරෙන් රාජ්‍ය උරුමවීමේ සම්ප්‍රදායන් බිඳ දමමින් රාජ්‍ය පැහැරගැනීම හා සම්බන්ධ සිදුවීම කුමක් ද?
(1) මුටසිව රජුගෙන් පසු දේවානම්පියතිස්ස රජු බලයට පැමිණීම.
(2) ධාතුසේන රජුට පසුව ඔහුගේ පුත් පළමුවන කාශ්‍යප රජු රාජ්‍යයට පත් වීම.
(3) කාවන්තිස්ස රජුට පසුව දුටුගැමුණු රජු රාජ්‍ය බලය ලබාගැනීම.
(4) දුටුගැමුණු රජුට පසුව ඔහුගේ සහෝදර සද්ධාතිස්ස රජවීම.

(15) පහත A, B, C හා D යටතේ දැක්වෙන ඓතිහාසික සිදුවීම් අතුරෙන් පණ්ඩුකාභය රාජ්‍ය සමයේ සිටින පුද්ගලයෙකුට අසන්නට දකින්නට නොලැබෙන සිදුවීම් මොනවාද?
A. ශ්‍රී මහා බෝධිරෝපණ උත්සවය C. අභය වැව ඉදිකිරීම
B. අනුරාධපුර නගරය ගොඩනැගීම D. එළාර දුටුගැමුණු සංග්‍රාමය
(1) A හා D ය. (2) A හා B ය. (3) B හා C ය. (4) B හා D ය.

(16) ශ්‍රී ලංකාවේ දේශපාන බලය මධ්‍යගත වීමෙන් අනතුරුව රජයේ වෙළඳ කටයුතු භාරව කටයුතු කළ රාජ්‍ය නිළධාරියා සෙල්ලිපිවල හඳුන්වා ඇත්තේ කෙසේ ද?
(1) වෙළඳ නායක (2) රූප අදෙක (3) පන අදෙක (4) කනපෙඩික

(17) පළමු විජයබාහු රජතුමා විසින් විවාහ කරගනු ලැබූ තිලෝකසුන්දරී බිසව කවර රාජ්‍ය වංසයකට අයත් කුමාරිකාවක් ද?
(1) මෞර්ය රාජ්‍යවංශය (2) ලම්භකර්ණ රාජවංශය
(3) පාණ්ඩ්‍ය රාජ්‍යවංශය (4) කාලිංඝ රාජවංශය

(18) හේන් වගා කිරීම වෙනුවෙන් රජුට ගෙවිය යුතු වූ කැති අඩ හා කෙටූ කනඹ අය යන බදු වර්ග දෙක අහෝසි කළ පොළොන්නරු යුගයේ සිටි පාලකයා කවුරුන්ද?
(1) ඉළනාග රජු (2) කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජු
(3) උත්තිය රජු (4) භාතිකාභය රජු

(19) ගෘහණියක විසින් එළදෙනකගෙන් කිරි දොවන ආකාරයක් පෙන්නුම් කරන කැටයමක් දක්වෙන සෙල්ලිපියකි.
(1) හතරවන කාශ්‍යප රජුට අයත් කොළඹ කෞතුකාගාරයේ ඇති ලිපියේ කැටයම
(2) වෙහෙරකෙම ලිපිය කැටයම
(3) ගල්පොත ලිපිය කැටයම
(4) සීගිරියට නුදුරු නාගපබ්බ විහාරයේ මහාමේරු ගලක ඇති කැටයම

(20) ශ්‍රී ලංකාවේ වෙළෙඳාම් කටයුතු සඳහා දායක වූ විදේශීය වෙළෙඳ සමූහයන් හඳුන්වනු ලබන්නේ.
(1) නිගම (2) නියමස්ථාන (3) නානාදේසි (4) කබොජ මහා පුගිය

(21) අරාබි ජාතික ඉතිහාසඥයෙකු වූ අල්බලසූරිගේ වාර්තාවල ශ්‍රී ලංකාව හඳුන්වා ඇත්තේ කුමන නමකින් ද?
(1) සෙයිලැන් (2) සෙරන්ඩිබ් (3) පාරසමුද්‍ර (4) රතු කැට දිවයින

(22) පහත A සිට D දක්වා දී ඇති මූලාශ්‍ර අතරින් ග්‍රීක මූලාශ්‍රයන් පමණක් දක්වෙන පිළිතුර තෝරන්න.
A. නැචුරාලිස් හිස්ටෝරියා
B. ක්වේරොස්ගේ ලංකාධිපත්‍ය
C. ඔනෙසි ක්‍රිටස්ගේ වාර්තා
D. බැල්ඩියස්ගේ ලංකා පුරාවෘත්තය
(1) D හා C (2) A හා C (3) B හා C (4) A හා D

(23) ශ්‍රී ලංකාවේ ඉතිහාසය සම්බන්ධ පහත සඳහන් ඓතිහාසික සිදුවීම් සිදු වූ ඓතිහාසික අනුපිළිවෙළට ගැළපූ විට ලැබෙන පිළිතුර කුමක් ද?
A. අයිස් යුගය අවසන් වී ලෝකය උණුසුම් වීමත් සමග කෘෂිකර්මයට සුදුසු පරිසර තත්ත්වයක් ගොඩනැගීම.
B. ගම් වැව් ඉදිකිරීම.
C. ශ්‍රී ලංකාව මානව ජනාවාසයක් බවට පත්වීම.
D. දේවානම්පියතිස්ස රජු අශෝක අධිරාජ්‍යයා සමග මිත්‍ර සබඳතා පැවැත්වීම.
(1) ABCD (2) BDCA (3) CABD (4) DCAB

● **පහත දක්වෙන ප්‍රකාශ ඇසුරෙන් 24 හා 25 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
A. පැරණි ජනයාගේ නිර්මාණාත්මක හැකියාව තාක්ෂණය හා වාස්තු විද්‍යාව පිළිබඳ තොරතුරු අනාවරණය වීම
B. සිංහල අක්ෂරමාලාවේ විකාශනය පිළිබඳ තොරතුරු අනාවරණය වීම.
C. අපේ සංස්කෘතික ඉතිහාසය පිළිබඳ ජීවමාන සාක්ෂි වීම.
D. ඓතිහාසික කාල අනුපිළිවෙළ සකස් කරගැනීම.
E. එක් මූලාශ්‍රයකින් ලැබෙන තොරතුරු තවත් මූලාශ්‍රයකින් සනාථ වීම.

(24) සාහිත්‍ය මූලාශ්‍රය වල වැදගත්කම සම්බන්ධයෙන් වඩාත් නිවැරදි තොරතුරු සඳහන් පිළිතුරු කාණ්ඩය කුමක් ද?
(1) D හා E (2) B හා D (3) A හා C (4) C හා E

(25) ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමේ දී පුරාණ නටබුන්, චිත්‍ර, මූර්ති හා පුරාවස්තු සම්බන්ධයෙන් වඩාත් නිවැරදි පිළිතුරු කාණ්ඩය තෝරන්න.
(1) A හා C (2) B හා E (3) A හා D (4) E හා C

(26) මුල් ඓතිහාසික යුගයේ ජනාවාස අතර ධීවරයන් විසූ ගම්මාන සෙල්ලිපිවල හඳුන්වා ඇත්තේ කෙසේ ද?
(1) කසීකාර ගාම (2) නිගම්
(3) කේවට්ටගාම (4) වඩ්ඩකීගාම

(27) රුවන්වැලිසෑ මළුවේ පිහිටි මෙම පිළිරුවෙන් නිරූපිත පුද්ගලයා කවුරුන් ද?
(1) දුටුගැමුණු රජතුමා (2) වළගම්බා රජතුමා
(3) මහපැරකුම් රජතුමා (4) භාතිකාභය රජතුමා



(28) පැරණි අභිලේඛනමය මූලාශ්‍රයන්හි යාපන අර්ධද්වීපය හඳුන්වා ඇත්තේ.
(1) නාගදීපය නමිනි. (2) කත්තරොඩෙයි නමිනි.
(3) නකදිව නමිනි. (4) නල්ලූර් නමිනි.

(29) වසභ රජුට පසුව අනුරාධපුර සිහසුන උරුම වූ ඔහුගේ පුත්‍රයා කවුරුන් ද?
(1) පළමු ගජබාහු රජු (2) වංක නාසික තිස්ස රජු
(3) කාවන්තිස්ස රජු (4) මහසෙන් රජු

(30) පහත (i) තීරුවේ සඳහන් කර්මාන්ත හා (ii) තීරුවේ සඳහන් එම කර්මාන්ත සෙල්ලිපි හඳුන්වා ඇති අයුරු නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර කුමක් ද?

| (i) තීරුව | (ii) තීරුව |
|---|---|
| 1. කම්මල්කරුවන්<br>2. රන්කරුවන්<br>3. ඇත්දත් කැටයම් | A. තබකර<br>B. කබර<br>C. දවික<br>D. තුලාධාර |

(1) D, B, C (2) C, D, B (3) B, D, C (4) A, D, C

(31) මහා ග්‍රාමයේ සිට අනුරාධපුරයට පැමිණි අයෙක් එහි වෙළෙඳසැලකින් සුවඳ විලවුන් මිලදීගත් කථා පුවතක් සාහිත්‍ය මූලාශ්‍රවල සඳහන් වේ. එම පුද්ගලයා කවුරුන් ද?
(1) දුටුගැමුණු (2) සද්ධාතිස්ස (3) කාවන්තිස්ස (4) සුරනිමල

● **පහත A, B C හා D වලින් දැක්වෙන ප්‍රකාශ/පද යුගල අධ්‍යයන කර 32 සිට 34 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A. 1. ස්ථිරවාසිතාව.
   2. ගම්මාන බිහිවීම.

B. 1. ශිලාමෙවලම්
   2. වෙර පහර

C. 1. රුවන්වැලි සෑය
   2. වජ්‍රචුම්බට

D. 1. යකඩ නිස්සාරණය
   2. ප්‍රාග් ඓතිහාසික ගල් යුගය

(32) කිසිදු සම්බන්ධතාවයක් නොදක්වන ප්‍රකාශ/පද යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

(33) පළමුවැන්න නිර්මාණය සඳහා දෙවැන්න උපකාරී වූ බව දැක්වෙන ප්‍රකාශ/පද යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

(34) දෙවැන්න ඇතිවීම සඳහා පළමුවැන්න හේතුවන බව සඳහන් ප්‍රකාශ/පද යුගලය කුමක්ද?
(1) A (2) B (3) C (4) D

(35) මින්නේරිය, ගිරිතලේ, කවුඩුල්ල හා කන්තලේ යන වැව්වලට ජලය ලබාගැනීම සඳහා අඹන්ගඟ හරස් කර ඉදිකරන ලද ඇළ මාර්ගය කුමක් ද?
(1) යෝධ ඇළ (2) තල්වතු ඇළ (3) මිනිපේ ඇළ (4) ඇළහැර ඇළ

(36) පැරැන්නන් විසින් දිග මැනීම සඳහා භාවිතා කරන ලද කුඩාම ඒකකය කුමක් ද?
(1) අණු (2) පරමාණු (3) තජ්ජාරි (4) රථරේණු

(37) ජල තරංගවලින් වැව් බැම්ම සේදී යාම වැළැක්වීම සඳහා ශ්‍රී ලාංකික වාරි ඉංජිනේරුවරුන් විසින් වැවට එක්කළ අංගය කුමක් ද?
(1) සොරොව්ව (2) රළපනාව (3) ඇතුළුවාන (4) දියකැට පහන

(38) තෙවරක් ම රට පාලනය කළ රැජිනිය ලෙස ඉතිහාසයේ සඳහන් වන්නේ මින් කවර තැනැත්තියක් ද?
(1) ලීලාවතී (2) කළ්‍යාණවතී (3) සුගලා (4) චූලසීවලී

(39) අපේ පැරණි මිනුම් ක්‍රම කිහිපයක් පහත දැක්වේ.
A. ලාහ B. අමුණු C. අක D. හවජර
අපේ පැරැන්නන් විසින් අවකාශය මැනීම සඳහා භාවිත කල මිනුම් ක්‍රම වූයේ,
(1) A හා D ය. (2) B හා C ය. (3) C හා D ය. (4) A හා B ය.

(40) ගැබිනි මව්වරුන්ගේ අවශ්‍යතා සඳහා පසවන්තිනාමශාලා ඉදිකළ රජතුමා කවුද?
(1) පස්වන මහින්ද රජු (2) හතරවන කාශ්‍යප රජු
(3) පළමුවන උපතිස්ස රජු (4) කනිට්ඨතිස්ස රජු

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

33 | S | II

# දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019
# Second Term Test - Grade 10 - 2019

නම/විභාග අංකය : ................................ ඉතිහාසය - II

කාලය : පැ. 03යි.
අමතර කියවීම් කාලය මි. 10

උපදෙස්
* I කොටසෙහි පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
* II කොටසින් ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
* පිළිතුරු සැපයිය යුතු මුලු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.
* අමතර කියවීමේ කාලය ප්‍රශ්නපත්‍රය කියවා ප්‍රශ්න තෝරාගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය ලබාදෙන ප්‍රශ්න සංවිධානය කරගැනීමටත් යොදාගන්න.

## I කොටස

(01) (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද (ii) යටතේ දක්වා ඇති ස්ථාන සියල්ල ම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ද ලකුණු කර නම් කරන්න.

(i) යාපනය, මාන්තායි, පොළොන්නරුව, යාන් ඔය, දේවනගර, උරුවේල, නාච්චදූව වැව, මැණික් ගඟ, සල්වත්තොට, කොළඹ, මහනුවර, ගල්ඔය (ජලාශය) (ලකුණු 12)

(ii) ඇෆ්ගනිස්තානය, රතු මුහුද, කොරියානු අර්ධද්වීපය, රෝමය, ගංගානම් නදිය, සුමාත්‍රා දූපත (ලකුණු 06)

(ආ) (i) පහත A, B, C, D යන ඓතිහාසික තොරතුරුවලට අදාළ පිළිතුරු අනුපිළිවෙලින් ලියන්න.

A රත්නපුර හා ඒ අවට ප්‍රදේශවල පිහිටි මැණික් පතල්වල පොළව මට්ටමේ සිට අඩි 90පමණ ගැඹුරින් පිහිටි බොරලු මිශ්‍ර පස් තට්ටුව හඳුන්වන නම

B ජනතාව විසින් අතහැර දැමූ වාපි ගම්මාන.

C කුඩා අවධියේ 'කීර්ති' කුමාරයා නමින් හැඳින් වූ පාලකයා

D අතීත සෙල්ලිපිවල ''වත්හිමි'' යනුවෙන් හඳුන්වා ඇත්තේ කවුරුන් ද? (ලකුණු 04)

(ii) A හා B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.



1. මෙම ඡායාරූපය හඳුනාගෙන නම් කරන්න.
2. මෙම නිර්මාණය දැකගත හැකි ස්ථානය නම් කරන්න.
3. මෙම නිර්මාණය කුමන යුගයකට අයත්වේද?
4. සෙනරත් පරණවිතාන මහතාගේ මතයට අනුව මෙම කැටයම මගින් කවුරුන් නිරූපණය වේද?

(ලකුණු 04)

(iii)



1. මෙම ඡායාරූපය හඳුනාගෙන නම් කරන්න.
2. මෙම නිර්මාණය ඉදිකරන ලද ස්ථානය නම් කරන්න.
3. මෙය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රයෝජනයට ගෙන ඇති ස්වාභාවික බලවේගය කුමක් ද?
4. මේ හා සමාන නිර්මාණයක් ශ්‍රී ලංකාවේ හමුවූ වෙනත් ස්ථානයක් දක්වන්න.

(ලකුණු 04)

(02) (i) පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(a) ශ්‍රී ලංකාවේ පැරණිතම වංසකතාව කුමක් ද?

(b) ශ්‍රී ලංකාවේ අඛණ්ඩ ඉතිහාසය හැදෑරීමේ දී වැදගත්ම සාහිත්‍ය මූලාශ්‍රය කුමක් ද?

(c) ශ්‍රී ලංකාව පිළිබඳ තොරතුරු සඳහන්වන චීන මූලාශ්‍රයක් නම් කරන්න.

(ලකුණු 03)

(ii) මහාවංශය රචනා කිරීම සඳහා තොරතුරු ලබාගත් සාහිත්‍ය මූලාශ්‍රයන් හතරක් නම් කරන්න. (ලකුණු 04)

(iii) සෙල්ලිපි ලිවීමට පදනම් වූ කරුණු දෙකක් දක්වා ඉතිහාසය හැදෑරීමේ දී පුරාවිද්‍යාත්මක මූලාශ්‍රවල වැදගත්කම කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) කරුණු තුනක් ඇසුරෙන් ඉතිහාසය ඉගෙනීමේ වැදගත්කම විස්තර කරන්න. (ලකුණු 06)

(03) (i) පහත සඳහන් ප්‍රාග් ඓතිහාසික ජනාවාසයන්ට අයත් ස්ථානයන් වරහන තුළින් තෝරා නිවැරදි අනුපිළිවෙළින් ලියා දක්වන්න.

(a) වෙරළාශ්‍රිත එළිමහන් කඳවුර

(b) පහත රට තෙත් කලාපීය ලෙන

(c) කඳුකර එළිමහන් දඩයම් ස්ථානය

(බටදොඹලෙන/පතිරාජවෙල/බණ්ඩාරවෙල/බෙල්ලන් බැදි පැලැස්ස) (ලකුණු 03)

(ii) ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික ගල් යුගයේ මානවයා තම ජනාවාස තෝරාගැනීමේ දී අවධානය යොමු කළ කරුණු 2ක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) ප්‍රාග් ඓතිහාසික ගල්යුගයේ තාක්ෂණය පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) ප්‍රාග් ඓතිහාසික ගල් යුගයේ මානවයා අවමංගල්‍ය කටයුතු සම්බන්ධයෙන් අනුගමනය කළ චාරිත්‍ර දෙකක් ඇසුරෙන් ගල් යුගයේ අභිචාර විධි පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 06)

(04) (i) ශ්‍රී ලංකාවේ මුල් යකඩ යුගයේ දී භාවිතා කරන ලද ක්‍රමවත් නූතන ක්‍රම තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) පූර්ව ඓතිහාසික යුගයේ මානවයා මැටි බඳුන් නිපදවීමේ දී අනුගමනය කළ ප්‍රායෝගික පියවරයන් හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) උඩරංචාමඩම නිවසෙන් හමු වූ සාධක දෙකක් ඇසුරෙන් පූර්ව ඓතිහාසික යුගයේ කාන්තාවන් තම රූප සෞන්දර්ය පිළිබඳ උනන්දුවෙන් කටයුතු කළ අයුරු විස්තර කරන්න. (ලකුණු 05)

(iv) (a) මුල් ඓතිහාසික යුගයේ ජනාවාසවල ප්‍රධාන ලක්ෂණ දෙකක් නම් කරන්න.

(b) මුල් ඓතිහාසික යුගයට අයත් ජනාවාස පිළිබඳ පුරා විද්‍යාත්මක සාධක හමුවන ස්ථාන දෙකක් නම් කරන්න. (ලකුණු 06)

(05) (i) පැරණි ගම්මානවල ජීවත් වූ වැසියන් වෙන් වෙන්ව පැවති පහත ගම්මාන හඳුනාගත් අයුරු සඳහන් කරන්න.

(a) තමන් විසූගම

(b) තමන්ගේ ගමට යාබදව පිහිටි ගම

(c) ඈතින් පිහිටි ගම (ලකුණු 03)

(ii) පූර්ව රාජ සමයේ දී ගමික හෙවත් ග්‍රාමිකගෙන් ඉටු වූ කාර්යයන් හතරක් නම් කරන්න. (ලකුණු 04)

(iii) මූලාශ්‍රයන් දෙකක් ඇසුරෙන් ගමිකවරයෙකු තේරීපත් වූ අයුරු විස්තර කරන්න. (ලකුණු 05)

(iv) වර්ෂා කාලයේ දී ජලයෙන් පුරවාගන්නා කුඩා ගම්වැව්වල ජලය ප්‍රමාණවත් නොවීමට හේතු තුනක් දක්වා එම ගැටළුව විසඳුම් ලෙස එම යුගයේ ජනයා ගත් ක්‍රියාමාර්ගය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

(06) (i) ශ්‍රී ලංකාවේ දේශපාලන බලය බෙදීගිය ක්‍රමයක් හෙවත් විමධ්‍යගත පාලනයක් පැවති අවධියේ පරිපාලන කටයුතුවලට සම්බන්ධ වූ නිලධාරීන් කවුරුන් දැයි කෙටියෙන් හඳුන්වන්න.

(a) පරුමක ලු -

(b) පොවනි රජ -

(c) දසගම් ඇත්තන් - (ලකුණු 03)

(ii) දේවානම්පියතිස්ස රාජ්‍ය සමයේ දී සිදු වූ වැදගත් සිදුවීම් හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) (a) ශ්‍රී ලංකාව පළමුවරට එක්සේසත් කළ පාලකයා කවුරුන් ද?

(b) ඒ සඳහා ඔහුට සහයෝගය ලබාදුන් පරුමකවරුන් දෙදෙනෙකු නම් කරන්න.

(c) රටේ ජනතාව රජතුමාගෙන් අපේක්ෂා කළ සේවා දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) කරුණු තුනක් ඇසුරෙන් වසභ රාජ්‍ය සමයේ වැදගත්කම කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

(07) (i) අතීත පාලනය සම්බන්ධව මූලාශ්‍රවල යෙදී තිබෙන පහත වචනවල අදහස දක්වන්න. (ලකුණු 03)

1. එක් තැන් සමිය
2. සභාව
3. මහලේ

(ii) පහත සඳහන් ඓතිහාසික සිදුවීම සම්බන්ධ පාලකයින් වරහන් තුළින් තෝරා අනුපිළිවෙළින් ලියන්න.

1. ඉන්දියාවේ චේර රාජ්‍යයේ පත්තිනි දේවාලයක් විවෘත කිරීමේ උත්සවයකට සහභාගි වීම.
2. රෝමාණුක දේශයට දූතයන් යවා රුවන්වැලිසෑයට පූජාවක් පැවැත්වීම සඳහා වීදුරු පබළු ගෙන ඒම.
3. ශ්‍රී ලංකාවෙන් චීනයට දූතගමන් විස්සක් පමණ සිදුවීම.
4. පොළොන්නරුවේ දළදා මාලිගයේ ආරක්ෂාවට වේලෙක්කාර් කුලී හමුදාව යෙදවීම.

(කනිට්ඨතිස්ස රජු, පළමු ගජබාහු රජු, පළමු පැරකුම් රජු, පළමු විජයබාහු රජු, හයවන අග්ගබෝධි රජු, හතරවන කාශ්‍යප රජු) (ලකුණු 04)

(iii) ශ්‍රී ලංකාවේ පැරණි සමාජයේ ගොවිතැන් කටයුතු කළ ආකාර දෙක පහදන්න. (ලකුණු 05)

(iv) ශ්‍රී ලංකාවේ දේශීය හා විදේශීය වෙළෙඳාම් කටයුතු සිදු වූ ආකාරය උදාහරණ සපයමින් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

(08) (i) මහවැව් ඉදිකිරීමේ අරමුණු තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) මහවැව් ඉදිකිරීමේ දී තාක්ෂණය උපරිමයෙන් භාවිතා කළ යුතුය. පහතින් දක්වා ඇති වැවක කොටස්වලින් ඇති ප්‍රයෝජන ලියන්න.

A. වැව් බැම්ම B. පිටවාන

C. මඩසොරොව්ව D. මොහොළ (ලකුණු 04)

(iii) ප්‍රාග් ඓතිහාසික ගල් යුගයේ සිට පූර්ව ඓතිහාසික යුගය දක්වා ලංකාවේ නිවාස ඉදිකිරීමේ තාක්ෂණය පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) රුවන්වැලිසෑයේ අත්තිවාරම ඉදිකිරීමේ තාක්ෂණය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(09) (i) පැරැන්නන් බර මැනීම සඳහා භාවිතා කළ මිමි වර්ග තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) අතීත පාලකයින් ජනතාවගේ සනීපා රක්ෂාව හා ස්වස්ථතාවය වෙනුවෙන් ගත් ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) සීගිරියේ ජලමල් උද්‍යානයේ නිර්මාණශීලීත්වය පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) අතීත ශ්‍රී ලංකාවේ පැවති කෘෂිකර්මාන්තය හා සම්බන්ධ කෙම්පහන් ක්‍රම හා යාගහෝම ඇසුරෙන් පැරණි සමාජයේ පැවති චාරිත්‍රයන් පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

Answer

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

33 S I,II

## දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019
## Second Term Test - Grade 10 - 2019

### ඉතිහාසය - පිළිතුරු පත්‍රය

### I පත්‍රය

| | | | |
|---|---|---|---|
| 01. 02 | 11. 02 | 21. 04 | 31. 04 |
| 02. 01 | 12. 03 | 22. 02 | 32. 04 |
| 03. 04 | 13. 02 | 23. 03 | 33. 02 |
| 04. 04 | 14. 02 | 24. 01 | 34. 01 |
| 05. 01 | 15. 01 | 25. 01 | 35. 04 |
| 06. 04 | 16. 03 | 26. 03 | 36. 02 |
| 07. 03 | 17. 04 | 27. 04 | 37. 02 |
| 08. 02 | 18. 02 | 28. 03 | 38. 01 |
| 09. 04 | 19. 04 | 29. 02 | 39. 04 |
| 10. 03 | 20. 02 | 30. 03 | 40. 03 |

(ලකුණු 1x40 = 40)

### II පත්‍රය

(01) (අ) (i) ලංකා සිතියම

(ii) ලෝක සිතියම

(ආ) (i) A. ඉල්ලම්

B. ඔළගම්

C. විජයබාහු රජතුමා

D. රජු

(ii) 1. මිනිසා හා අශ්ව හිස කැටයම

2. ඉසුරුමුණි විහාරය

3. අනුරාධපුර යුගයි

4. වැස්සට අධිපති දෙවියන් වන අග්නි හා පර්ජන්‍ය

(iii) 1. යකඩ නිස්සාරණය කිරීමේ උදුනක්/උදුනක ආකෘතියක්

2. සමනළ වැව ප්‍රදේශයේ

3. ස්වාභාවික සුළං බලය

4. සීගිරිය අලකොළ වැව දෙහිගහ ඇළ කන්ද

(02) (i) (a) දීපවංසය

(b) මහාවංසය

(c) පාහියං හා හියුං සියෑං ගේ වාර්තා (බෞද්ධ රාජධානි පිළිබඳ විස්තරය)

(ii) දීපවංසය, සිහලට්ඨකථා මහාවංසය, උත්තර විහාරට්ඨ කතා, විනයට්ඨකතා

(iii) භික්ෂූන් වහන්සේලාට ලෙන් පූජා කිරීම.

විහාරාරාමවලට ගම්බිම් පිදීම

විහාරාරාම පාලනය

රජයේ නීති රීති පිළිබඳ දැනුවත් කිරීම

බදු අයකිරීම/ වෙළෙඳාම

වරදකරුවන්ට දඬුවම් ලබාදීම

සේවා ඇගයීම් වැනි කරුණු දෙකක් දක්වා

ඉතිහාසය ඉගෙනීමේ දී පුරාවිද්‍යාත්මක මූලාශ්‍රවල වැදගත්කම විස්තර කර තිබීම.

අතීත, දේශපාලන සමාජ, සංස්කෘතික, සමාජීය, ආර්ථික තොරතුරු රැස්කරගත හැකි වීම.

සාහිත්‍ය මූලාශ්‍රවලට වඩා විශ්වාසනීය තොරතුරු ලබාගත හැකිවීම.

සාහිත්‍ය මූලාශ්‍රවල අඩුපාඩු පූරණය කරගැනීම

සාහිත්‍ය මූලාශවල සඳහන් තොරතුරු සනාථ කරගැනීම සඳහා ඇසුරෙන් විස්තර කිරීම.

(iv) තමා ජීවත්වන සමාජය හා ලෝකය පිළිබඳ යථාවබෝධය ලැබීම.

අතීත අත්දැකීම් මගින් වර්තමානය තේරුම් ගෙන අනාගතය ගොඩනැගීම.

රටේ ජාතික අනන්‍යතාව හඳුනා ගැනීම.

ජාතික සමගිය ගොඩනැගීම

අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීමට හුරු වීම.

විවිධ මත ඉවසීමට හුරුවීම.

ආදී කරුණු ඇසුරෙන් විස්තර කරන්න.

මුළු ලකුණු = 10 යි.

(03) (i) (a) පතිරාජවෙල
(b) බටදොඹලෙන
(c) බණ්ඩාරවෙල

(ii) ජලපහසුව
ආහාර සුලබ වීම හා පහසුවෙන් ලබාගත හැකිවීම.
ගිලා මෙවලම් සෑදීමට අවශ්‍ය පාෂාණ වර්ග පහසුවෙන් ලබාගත හැකිවීම.

(iii) ගල් යුගයේ තාක්ෂණය සම්පූර්ණයෙන්ම ගිලා මෙවලම් නිපදවීම මත රදා පවතින බව
ගිලා මෙවලම් තනාගැනීම සඳහා වෙරපහර නොහොත් පීඩන ගල්කනය යොදා ගැනීම.
මුල් යුගයේ දී විශාල ගිලා මෙවලම් හෙවත් රළුගිලා මෙවලම් ද පසුකාලීනව ඊට වඩා දියුණු කාර්යක්ෂම ජ්‍යාමිතික හැඩයේ ක්ෂුද්‍රගිලා මෙවලම් ඉදිකිරීම.
ජ්‍යාමිතික ක්ෂුගිලා මෙවලම් ඉදිකිරීම සඳහා වැඩි වශයෙන් තිරිවානාගල් (බිම් විදුරු) ද සුළු වශයෙන් කහද ගල් ද භාවිතා කරන ලදී.
ජ්‍යාමිතික ගිලා මෙවලම මගින් දඩයම, කැපීම, සීරීම තැලීම හා හැරීම ආදී කාර්යයන් ඉටුකරගත හැකි බව.

(iv) චාරිත්‍රයන්
ජීවත් වූ ගල්ලෙන තුළ නොගැඹුරු වලක් හාරා වළ දැමීම.
හිස්කබල දෙකට බෙදෙන සේ සිදුරු කිරීම
උදා රාවණා ඇල්ල
හිස්කබලේ රළු දාර හා පිටතට නෙරා ඇති කොටස් ගලක උලා ඔප මට්ටම් කිරීම.
උදා රාවණා ඇල්ල
හිස් කබලේ එක් පසෙක ගුරුගල් ආලේපය
සිරුර ගුහාවෙන් පිටත වලදමා මස් දියවී ගිය පසු සැකිල්ල ගොඩගෙන ගුහාව තුළ නොගැඹුරු වලක් හාරා සැකිල්ල නවා වකුටුකර වළ දැමීම.
ඇසුරෙන් උදාහරණ සහිතව විස්තර කරන්න.

(04) (i) ගිලා මංජුසා සොහොන් (මහා ගිලා සුසාන)
මැටි ඔරු සුසාන
භරණී සුසාන

(ii) සුදුසු මැටි වර්ගය තෝරාගැනීම.
මැටි අවශ්‍ය පදමට පදම් කිරීම.
සකපෝරුව භාවිතයෙන් සකසා වියළා ගැනීම.
අවශ්‍ය පමණට වියළා ගැනීම.
අවශ්‍ය උෂ්ණත්වය යටතේ පුළුස්සා ගැනීම.

(iii) සාධක
මැටි පබළු
කහ සහ රතු ගුරු ගල්
ඇස අඳුන් තැබීමට භාවිත කරන ලෝහ කූර
ඇසුරින් විස්තර කරන්න.

(iv) (a) කුඩාවැව් කේන්ද්‍රගතව පැවතීම.
(වාරි ගම්මාන)
ගංගාවල පිටාර නිම්නයට පිටතින් පිහිටා තිබීම.
ගම් එකින් එක ස්වාධීනව පැවතීම.
වෘත්තීන් අනුව ගම් වෙන් වෙන්ව පැවතීම.
සමහර ගම් වැටකින් ආරක්ෂාවීම.
(පරික්ඛිත/ අපරික්ඛිත)

(05) (i) (a) අපේගම
(b) අල්ලපු ගම
(c) පිටගම්

(ii) - ගම් අතර සිදු වූ කටයුතු වලදී ගම නියෝජනය
- විවිධ ආරවුල් විසඳීම.
- ගමේ පොදු කටයුතුවල දී නායකත්වය ලබා දීම.
- ගමේ වැව ඉදිකිරීම/ නඩත්තු කිරීම.
- වැවේ ජලය බෙදා හැරීම.

(iii) - වත්පොහොසත් කම් ඇති ගෘහපතිවරයෙක් ගමික ලෙස පත්වීම. (ජාතක කථාව)
- පොදු විශ්වාසය දිනාගත් පුද්ගලයා (ගෘහපතිවරුන් අතරින් ගමික ලෙස පත්වීම.
(බුද්ධඝෝෂ හිමියන්ගේ සමන්තපාසාදිකාව)
තොරතුරු ඇසුරෙන් විස්තර කර තිබීම.

(iv) ගම්වල ජනගහනය ඉහළ යාම.
පරිභෝජනය සඳහා වැඩි ජල ප්‍රමාණයක් අවශ්‍ය වීම.
ඉහළ යන ජනගහනයට සාපේක්ෂව ආහාර නිෂ්පාදනය වැඩි කිරීමට අවශ්‍ය වීම.
විසඳුම ගම්වැව් පද්ධති
(එල්ලංගාව /වාරිප්‍රපතනය) ඉදිකිරීම.
විස්තර කර තිබීම.

(06) (i) (a) ගම්වැව් පද්ධතියක් පාලනය කළ කාන්තාව
(b) නැගෙනහිර ප්‍රදේශයේ ප්‍රාදේශික රජු
(c) ගම් ප්‍රධානීන් දසදෙනෙකුගෙන් සමන්විත වූ මණ්ඩලය

(ii) අශෝක අධිරාජ්‍යා විසින් එවන ලද පංචකකුද භාණ්ඩ භාවිත කොට නැවත අභිෂේක වීම.
- දෙවන ප්‍රිය වලි විරුද නාම දායාද වීම.

- මහින්දාගමනය
- සංඝමිත්තා ගමනය

මෞර්ය පාලන ක්‍රමය දායාද වීම

(iii) (a) දුටුගැමුණු රජතුමා

(b) වේළුසුමන, ඵුස්සදේව, ථෙරපුත්තාභය, නන්දිමිත්‍ර වැනි දසමහා යෝධයින් දෙදෙනෙකු නම් කිරීම.

(c) රටේ සාමය, ආරක්ෂාව පවත්වාගෙන යාම/ ජනතාවගේ අධ්‍යාත්මික සංවර්ධනය රටේ ආර්ථික සංවර්ධනය ඇති කිරීම/ ජනතාවගේ සෞඛ්‍ය පහසුකම් නගා සිටුවීම.

(iv) - ශ්‍රී ලංකාව ආස්ථානවලට බෙදා විධිමත්ව
- පාලනය කිරීම. (වල්ලිපුරම් සන්නස)
- අයබදු අය කිරීම වඩා විධිමත් කිරීම
- ලම්භකර්ණ රාජ වංසයේ ආරම්භක පාලකයා
- මහවැව් ඉදිකිරීමේ ආරම්භකයා වීම.

(07) (i) එක්තැන් සමිය - රාජ සභාව

සභාව - අධිකරණය/නිලධාරී සහභාගීත්වය

මහලේ - මහලේකම් (පිටුව 44 හා 45)

(ii) 1. පළමු ගජබාහු රජු

2. භාතිකාභය රජු

3. හයවන අග්ගබෝධි රජු

4. පළමුවන විජයබාහු රජු

(iii) හේන් ගොවිතැන, මඩ/කුඹුරු ගොවිතැන (පිටුව 47)

(iv) දේශීය වෙළෙඳාම

- නගරවල වෙළෙඳසැල් පැවැතීම.
- සීගිරියේ සෙල්ලිපියක සියඹලා වෙළෙන්දෙක් පිළිබඳ තොරතුරු සඳහන් වීම.
- හම්බන්තොට මණ්ඩගල ලිපියේ ගල්ලෙනක් පූජාකළ සුමන නම් වෙළෙන්දෙක් පිළිබඳ තොරතුරු සඳහන් වීම.
- අනුරාධපුරයේ දකුණු දොරටුව අසල කාලසුමන නම් වෙළෙඳපොළක් තිබූ බව මූලාශ්‍රවල සඳහන් වීම.
- වෙළෙඳපොළ පාලනය පිළිබඳ නීතිරීති හතරවන උදය රජුගේ බදුළු ටැම් ලිපියේ සඳහන් වේ.

විදේශීය වෙළෙඳාම

- වෙළෙඳ සමූහ (පූග) ලෙසින් වෙළෙඳාම් කිරීම.
- ලංකාවේ දෙමළ සෙල්ලිපිවල නානාදේසී/ වලඤ්ඤයාර්/අයිනූරුවර් වැනි දකුණු ඉන්දීය වෙළෙඳ සමූහ වෙළෙඳාම් කළ බවට තොරතුරු සඳහන් වීම.
- බෝවත්තේගල සෙල්ලිපියේ කාම්බෝජ වෙළෙඳ සමූහයක් පිළිබඳ තොරතුරු සඳහන් වීම.
- ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ මධ්‍යගතව පිහිටීම නිසා ලංකාව පෙර අපරදිග වෙළෙඳ භුවමාරු මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාකිරීම.
- ලංකාව වටා පිහිටි වරායන් නිසා ලංකාව විදේශීය වෙළෙඳාමට විවෘත වූ බව

ආදිය විස්තර කර තිබීම.

(08) (i) - කෘෂිකාර්මික කටයුතු සඳහා
- ගංවතුර පාලනය කිරීමට
- නාගරික අවශ්‍යතා සඳහා වැනි උචිත පිළිතුරු

(ii) A. වැවෙහි ජලය රඳවා ගැනීම.

B. වැවට පිටතින් ලැබෙන ජලය වැවට ඇතුල් කිරීම.

C. වැවට රැස්වෙන රොන්මඩ ඉවත් කිරීම.

D. සොරොව්ව මගින් ජලය පිට කිරීම පාලනය කිරීම.

(iii) - ප්‍රාග්ඓතිහාසික ගල් යුගය

ස්ථිර නිවාස නැත

ගල්ගුහා හා එළිමහන් ස්ථාන ජනාවාස ලෙස තෝරාගැනීම.

- කිතුල්ගල බෙලිලෙන

ගල් බැම්මක කොටසක් හමුවීම.

- උඩරංචාමඩම නිවස නටඹුන්

පොළොවට ගිලා නොබසින ලෙස සකස් කිරීම.

පොළවට ලම්බකව බිත්ති බැඳීම

වරිච්චි බිත්ති

වහළ නොතෙමෙන පරිදි සකස් කර ගැනීම.

පිළිස්සි ගිය වරිච්චි මැටි හමුවීම.

(iv) පෙළපොත 69 පිටුව

(09) (i) වීහ/ ගුඤ්ජා/ මාසක/ අක/ ධරණ/ ස්වරණ

(ii) - රෝහල් ඉදිකිරීම

පණ්ඩුකාභය රජතුමා මාතෘ නිවාස ඉදිරිකිරීම (සිවිකා සාලා)

උපසග්ග රෝග නාස

පසවන්ති නාම ශාලා


ආලාහන පිරිවෙන

- රෝහල් නඩත්තුවට ගම්බිම් වෙන් කිරීම
- වැසිකිළි කැසිකිළි ඉදිකිරීම
- අපද්‍රව්‍ය පිටතට ගලායාම සඳහා කානු පද්ධති ඉදිකිරීම.

(iii) පෙළපොත 69/70 පිටුව


(iv) කෙම්පහන් ක්‍රමය හා කිරිමඩු යාගය ඇසුරින් සිදුකරන ලද විස්තර කිරීමට ලකුණු ලබාදෙන්න.

1. (අ) (i)
1. (அ) (i)
1. (a) (i)



යුරෝපය
ஐரோப்பா
Europe
අප්‍රිකාව
ஆபிரிக்கா
Africa
ඉන්දියන් සාගරය
இந்து சமுத்திரம்
Indian Ocean
උ


1. (අ) (i)
1. (அ) (i)
1. (a) (i)



1. (අ) (i)

1. (அ) (i)

1. (a) (i)



1. (අ) (i)
1. (அ) (i)
1. (a) (i)

